# Abstract 09

## ප්‍රේමය හා එහි චර්යා පිළිබඳ බෞද්ධ විග්‍රහය

**සචිනි කුෂානි දේවසිරි නාරායන,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*sachinikushani@gmail.com*

ප්‍රේමය වනාහි මනෝභාවයකි. මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක සංසිද්ධියක් වන එය ඇතැම්විට මිනිස් ජීවිතයේ පැවැත්ම, යහ පැවැත්ම හා නැවැත්ම ද තීරණය කරනු ලබයි. ප්‍රේමය නැමැති මනෝභාවය ජීවිතයට බද්ධවන ආකාරය කෙරෙහි මනෝ විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී ඇත. එය මිනිස් සිරුරේ ග්‍රාහක කාරක, මොළය සහ ස්නායු පද්ධතිය, නිර්නාල පද්ධතිය යන ප්‍රධාන අංශ හතරක් ඔස්සේ මිනිස් ජීවිතයට සම්බන්ධ වී ක්‍රියා කෙරේ. මනෝමූලික හැඟීමක් ලෙස ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වය අතර හටගැනෙන ප්‍රේමය පිළිබඳ **අංගුත්තරනිකායේ චිත්තපරියාදාන, පුරිසබන්ධන** හා **ඉත්ථිබන්ධන** යන සූත්‍රවල ද සාකච්ඡාවට භාජනය වී ඇත. පුද්ගලාන්තර භාවමය උද්දීපනය මගින් ජනිත වන මනෝභාවයක් වන ප්‍රේමය හා තදනුබද්ධ පුද්ගල චර්යාවල ස්වභාවය පිළිබඳ බෞද්ධ විග්‍රහය හඳුනාගැනීමට වෑයම් කිරීම මෙම පර්යේෂණ ක්‍රියාවලියේ අරමුණ වේ. **කාමය** සහ **ප්‍රේමය** වියුක්ත වශයෙන් හඳුනාගත නො හැකි තරම් ඒකාබද්ධ මනෝ භාවයක් බව පැහැදිලි කරුණකි. ලෞකික සමාජයක් තුළ වෙසෙමින් කාමයේ රුදුරු බවත් ප්‍රේමයේ විචිත්‍රත්වයත් අත්විඳීම සඳහා ධර්මයෙන් පෙන්වා දෙන සීමාවන් සහ ක්‍රමවේදයන් හඳුනා ගැනීමත් එයට ආචාර විද්‍යාත්මක පදනමක් අත්‍යවශ්‍ය ම වේ දැයි පිරික්සීමත් මෙහි එක් අරමුණක් වේ. වත්මන් තරුණ පරපුරෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් තීරණාත්මක සාධකයක් වන ප්‍රේමය පිළිබඳ නූතන මනෝවිද්‍යාත්මක මතය හඳුනා ගැනීමට අවකාශය හිමිවීමත්, ප්‍රේමය නැමැති මනෝභාවය පුද්ගල යහපැවැත්ම උදෙසා දායක කරගැනීමට බුදුදහමින් ලැබෙන පිටුබලය හඳුනා ගැනීමට හැකිවීම ද මෙහි තවත් ප්‍රතිඵලයකි. බෞද්ධ ඉගැන්වීම් අනුව යමින් සමස්ත විශ්වයට ම සාපේක්ෂ ප්‍රේමය නම් හැඟීමෙහි සැබෑ අර්ථය හා වටිනාකම අවබෝධ කරගැනීමට හැකිවීම මෙහි දී විශේෂ වේ.

**ප්‍රමුඛ පද :** ඉත්ථිබන්ධන සූත්‍රය, කාමය, පුරිසබන්ධන සූත්‍රය, ප්‍රේමය